(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 403.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 ඔක්තෝබර් මස 28 වැනි අඟහරුවාදා පූ. භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2581/'12

1.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (4)

(අ) (i) උතුරු පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගම්මානවලට කවර කාල සීමාවක් තුළදී විදුලිය ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) 2012 වර්ෂය තුළදී උතුරු පළාතේ එකී සියලු ගම්මානවලට විදුලිය ලබාදීමේ හැකියාවක් තිබුණේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3243/'12

2.
ගරු රවී කරුණානායක මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3688/'13

3\.
ගරු අනුර දිසානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) (i) 2011 සහ 2012 වර්ෂ දෙකම සඳහා පැවැත්වූයේ එක් රාජ්‍ය නාට්‍ය උළෙලක් බවත්;

(ii) වාර්ෂිකව පැවැත්විය යුතු එම උළෙල ඉහත සඳහන් පරිදි වර්ෂ දෙකකට වරක් පැවැත්වීමට හේතුව මුදල් නොමැතිකම බවත්;

යන්න එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උළෙල සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කළ ආකාරයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය අනුග්‍රහය මත නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ පැවැත්වූ "මහ සමයම" ප්‍රසංගයට වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලැබුණු ආකාරය කවරේද;

(iii) එම ප්‍රසංගයේ එක් එක් කටයුතු වෙනුවෙන් එම මුදල් වියදම් කළ ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3919/'13

4\.
ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) අඹ, කෙසෙල්, ගස්ලබු වැනි පළතුරු කල්තබා ගැනීමට සහ ඉක්මනින් ඉදවීමට ඇතැම් ව්‍යාපාරිකයින් විවිධ රසායනික ද්‍රව්‍ය භාවිතා කරන බව පිළිගන්නේද;

(ii) එලෙස භාවිතා කරනු ලබන ද්‍රව්‍යවල රසායන විද්‍යාත්මක නාම හා වෙළඳ නාම කවරේද;

(iii) එම රසායනික ද්‍රව්‍ය අතරින් මිනිස් සිරුරට අහිතකර ද්‍රව්‍ය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළතුරු ඉදවීමට සහ කල්තබා ගැනීමට මිනිස් සිරුරට අහිතකර රසායනික ද්‍රව්‍ය යොදා ගන්නා ව්‍යාපාරිකයින් නීතියේ රැහැනට හසුකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(ii) 2011 සහ 2012 වර්ෂවල නීතියේ රැහැනට හසුකර ගන්නා ලද එවැනි ව්‍යාපාරිකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් දඬුවම් ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4164/’13

5\.
ගරු පී. හැරිසන් මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාණ්ඩවල නම් කවරේද;

(ii) එම එක් එක් කාණ්ඩයට අයත් වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාණ්ඩ අතර සිටින සර්වාංග විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට 2013 දක්වා කාල සීමාව තුළ ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් බලපත්‍ර ලබාදී ඇති සමස්ත සම්බාහන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ඒවායේ ලිපිනයන් සමග දිස්ත්‍රික්ක මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අවසර ලබාදී ඇති වෛද්‍යවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) ආයුර්වේද දෙපාර්තමේන්තුවට අමතරව වෙනත් ආයතන මගින් සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබාදී තිබේ නම්, එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා තිබිය යුතු අවම වෘත්තීය සුදුසුකම් කවරේද;

(ii) එවැනි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ස්ථානයක තිබිය යුතු තත්ත්වයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4294/’13

6\.
ගරු රෝසි සේනානායක මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඩෙංගු රෝගීන්ට රජයේ රෝහල්වල ලබාදුන් ඩෙක්ස්ට්‍රන් 40 (DEXTRAN 40) නමැති සේලයින් වර්ගය ආනයනය කළ ආයතනයේ නම කවරේද;

(ii) එම සේලයින් වර්ගයේ තත්ත්වය පිළිබඳ යම් පරීක්ෂාවක් සිදුකර තිබේද;

(iii) 2013 ජනවාරි සිට අගෝස්තු දක්වා කාල සීමාව තුළදී එම සේලයින් වර්ගය ලබා දී ඇති ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම සේලයින් වර්ගය පිළිබඳව පැමිණිලි හෝ චෝදනා ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4558/’13

7\.
ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) නිවසක හිමිකමක් නැති, අඩු ආදායම්ලාභී, විදේශගත ශ්‍රමිකයින් සඳහා “රට විරුවෝ ණය වැඩසටහන” නමින් නිවාස ණය වැඩසටහනක් ක්‍රියාත්මක කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ණය වැඩසටහන ක්‍රියාත්මක කළ දිනය කවරේද;

(ii) එම ණය ලබාදීම සිදු කරනු ලබන බැංකු කවරේද;

(iii) එම එක් එක් බැංකුවේ මෙරට ක්‍රියාත්මකව පවතින ශාඛා සංඛ්‍යාව කොපමණද;

(iv) මෙම ණය ව්‍යාපෘතිය පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමට සහ ඊට අදාළව සිදුකර ඇති අනෙකුත් පරිපාලන කටයුතු වෙනුවෙන් දරන ලද වියදම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත වැඩසටහන යටතේ ණය මුදලක් ලබා ගැනීම සඳහා අදාළ වන කොන්දේසි සහ සුදුසුකම් කවරේද;

(ii) එක් අයකුට ලබා දෙන උපරිම ණය මුදල කොපමණද;

(iii) එම ණය මුදල වෙනුවෙන් අය කරනු ලබන පොලී අනුපාතය කොපමණද;

(iv) මේ වන විට එම ණය මුදල ඉල්ලුම් කර ඇති සංඛ්‍යාව සහ ණය ලබා දී ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4735/’14

8\.
ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට දිවයිනේ ඇති ගුරු අභ්‍යාස විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් දැනට ක්‍රියාත්මකව පවතින ගුරු අභ්‍යාස විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ දැනට පුහුණුව ලබන ගුරු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුරු අභ්‍යාස විද්‍යාලය ඉංග්‍රීසි ගුරු පුහුණුව සඳහා පමණක් වෙන් වී තිබේද;

(iii) නොඑසේ නම්, එම ගුරු විද්‍යාලයේදී වෙනත් විෂයයන් සඳහා ද පුහුණුව ලබා දෙන්නේද;

(iv) එසේ නම්, එම විෂයයන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) මහරගම ගුරු අභ්‍යාස විද්‍යාලයේ සිසුන්ට නේවාසික පහසුකම් තිබේද;

(ii) එසේ නම්, එම පහසුකම් ලබා දී ඇති ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) මෑතකදී එම ගුරු විද්‍යාලයේ ගොඩනැගිලි පිළිසකර කර ඇත්තේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) එම පිළිසකර කටයුතු සඳහා වැය කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4743/'14

9.

ගරු අශෝක් අබේසිංහ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලයට මහා භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති ණය ප්‍රමාණය කොපමණද;

(ii) ලංකා විදුලිබල මණ්ඩලය විසින් වාණිජ බැංකුවලින් ණය මුදල් ලබා ගෙන තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) ලාභ හෝ පාඩු නොමැති මට්ටමින් ලංකා විදුලිබල මණ්ඩලය පවත්වාගෙන යාම සඳහා ක්‍රියා මාර්ග ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4945/'14

10.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එවකට ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයට අයත්ව තිබූ "බඳුලුවෙල රක්ෂිතයේ" වර්ෂ 50 - 60ක් පමණ පැරණි තේක්ක වගාවක් ඇති බවත්;

(ii) කිසියම් පුද්ගලයෙකු කූට ලිපි ලේඛන සකසා එම ඉඩම පෞද්ගලික සින්නක්කර ඉඩමක් ලෙස භුක්ති විඳින බවත්;

(iii) පුද්ගලයන් කිහිප දෙනෙකු රජයට අයත් එම තේක්ක වගාව විනාශ කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වර්ෂ ගණනාවක් ආරක්ෂිතව තිබූ බඳුලුවෙල රක්ෂිතයේ තේක්ක වනය අනවසර පදිංචිකරුවන්ගෙන් රැක ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4960/'14

11.

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වයඹ පළාත් සභාවේ ධීවර අමාත්‍යාංශය විසින් ධීවරයින් සඳහා බෝට්ටු ලබා දීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලබන්නේද;

(ii) එම බෝට්ටු ලබාදීමට ධීවරයන් තෝරා ගන්නා ලද පදනම කවරේද;

(iii) එක් එක් බෝට්ටු වර්ගය සඳහා ධීවරයන් වෙත ලබා දෙන සහනාධාරයේ වටිනාකම කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ධීවරයන්ට ලබා දෙන එම බෝට්ටු වර්ග සහ ඒවායේ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ධීවර බෝට්ටුවක නිෂ්පාදන පිරිවැය එක් එක් බෝට්ටු වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වයඹ පළාත් සභාව මගින් 2010 වර්ෂයේ සිට මේ දක්වා ලබාදී ඇති ධීවර බෝට්ටු සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4962/’14

12.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පසුගිය වර්ෂය තුළ පොහොර සහනාධාරය ලබා දුන් ගොවීන් සංඛ්‍යාව එක් එක් බෝග වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොහොර සහනාධාර ක්‍රමය යටතේ පසුගිය වර්ෂයේ සිට ලබා දුන් රු.350.00ක පොහොර බෑගයක් සඳහා රු.150.00ක අමතර මුදලක් රක්ෂණාවරණයක් වශයෙන් අය කර ගත් බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, සහනාධාර යටතේ ලබා දෙන එක් පොහොර බෑගයක් වෙනුවෙන් රු.150.00ක මුදලක් අමතරව අය කර ගනිමින් ආරම්භ කළ රක්ෂණාවරණයේ පදනම කවරේද;

(iii) එම රක්ෂණාවරණය ආරම්භ කළ දින සිට මේ දක්වා ගොවීන්ගෙන් අය කර ගෙන ඇති මුළු මුදල කොපමණද;

(iv) එකී රක්ෂණාවරණය යටතේ හිමිකම් ඉල්ලීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5084/’14

13.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුලතිව්, තුනුක්කායි, උයිලම්කුලම් නිවාස 50 යෝජනාක්‍රමයේ පදිංචිකරුවන් සඳහා පානීය ජල පහසුකම් නොමැති බවත්;

(ii) එම නිවාස යෝජනාක්‍රමයේ පදිංචිකරුවන් පානීය ජලය සපයා ගැනීමේදී විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතියේ පදිංචිකරුවන්ගේ පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගන්නා පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5196/’14

14.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මකවන ගල් අඟුරු බලාගාර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලාගාරවල නම් කවරේද;

(iii) අලුතින් ඉදිකිරීමට යෝජිත ගල් අඟුරු බලාගාර සංඛ්‍යාව කොපමණද;

(iv) එම බලාගාර ස්ථාපිත කරන ප්‍රදේශ කවරේද;

(v) එම ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩම් ලබා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(vi) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයෙන් දැනට ජනනය කර ඇති විදුලි ඒකක සංඛ්‍යාව කොපමණද;

(vii) එය ලංකාවේ විදුලිබල අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රතිශතයක්ද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5226/’14

15.

ගරු තිස්ස අත්තනායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2014.05.27 වැනි දින රත්මලාන, අත්තිඩිය ප්‍රදේශයේ දී වෙළඳපොළට නිකුත් කිරීමට සූදානම් කර තිබූ රුපියල් කෝටි 50කට අධික වටිනාකමින් යුතු, කල් ඉකුත් වූ ඖෂධ තොගයක් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගින් අත්අඩංගුවට ගත් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඖෂධ තිබූ ගබඩාව අයත් ඖෂධ සමාගම කවරේද;

(ii) එම සමාගමේ ලියාපදිංචි අංකය සහ ලියාපදිංචි කළ වර්ෂය කවරේද;

(iii) ඉහත ඖෂධ තොගයට අයත් වූ ඖෂධ වර්ගයන්හි නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2014.05.27 වැනි දින වන විට ඉහත සඳහන් කල් ඉකුත් වූ ඖෂධ තොගයෙන් යම් ප්‍රමාණයක් වෙළඳපොළට නිකුත් කර තිබුණේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලැබූ පියවර කවරේද;

(iii) ඉහත ඖෂධ සමාගමට විරුද්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත (2015) — (තෙවැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2014 ඔක්තෝබර් 24) [1]

*2.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*3.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජුලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*9.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*12.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*13.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*14.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*15.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*16.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*17.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*18.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*19.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*20.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*22.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

26.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

27.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

28.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

29.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

30.

කල්පවෘක්ෂ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

සිව්මුනි සෑ වෙහෙර බෞද්ධ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---